# 2023 මාර්තු මස මාසික සභා රැස්වීම
# වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2023 මාර්තු මස මාසික සභා රැස්වීම 2023.03.16 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

| | | | |
|---|---|---|---|
| 1. | ගරු උප සභාපති | - | ඩබ්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එච්.සිරිපාල මැතිතුමා |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.ඒ.ගුණතිලක මැතිතුමා |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | ඒ.එබ්.සුමනාවතී මැතිතුමිය |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.ජී.යූ.ඩබ්.කුමාර මැතිතුමා |

## නිලධාරී සහභාගීත්වය

| | | | |
|---|---|---|---|
| 1. | ලේකම් | - | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |
| 2. | කළමනාකරණ සේවා නිලධාරී | - | ජී.අයි.යූ.ගුණසේකර මිය |
| 3. | සංවර්ධන නිලධාරි | - | යූ.කේ.ශානිකා මිය |

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපතිතුමා විසින් මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## I.පසුගිය සභා රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම

2023.02.09 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොටුව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 2.ගරු සභාපතිතුමාගේ නිවේදන

### 2.1 ජල බිල්පතේ නම සංශෝධනය කිරීම.

- එච්.ඒ.සුගතදාස නමින් ඇති අංක UD 1/14 දරණ ජල බිල්පත ඩබ්.එම්.එම්.කේ.එම්.වීරරත්න නමින් සංශෝධනය වන බව සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.
- ඩී.එම්.ජානිස් විජේතිස්ස නමින් ඇති අංක UD 217 දරණ ජල බිල්පත ආර්.එම්.කේ.ගයානි ලලිතා රාජපක්ෂ නමින් සංශෝධනය වන බව සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

## 3.සභාව නමින් ලැබී ඇති ලිපි, පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම.

3.1 නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා ,ගරු මන්ත්‍රිනී අචිනි එස්. අබේවික්‍රම මැතිතුමිය ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.කේ.ප්‍රසාද් අශිත මැතිතුමා ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගි නොවන බව දන්වා එවා ඇති බැවින්,නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

## 4.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5.කල් දී ඇති යෝජනා

5.1.ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. පී.ඩබ්.රංජිත් රණවීර,ඒ.බී.එන්.ප්‍රේමරත්න,එස්.එම්.ශශිකා සඳමාලි හා එම්.රාජේන්ද්‍රන් යන අයගේ සේවය ඉදිරි මාස තුනක් සඳහා මිලදී ගැනීමට අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසු එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

II. කොබ්බෑවියන්නලාගේ රේණුකා ජයසිංහ යන අයගේ දීර්ඝ කාලීන බදු බලපත්‍රය සකස් කිරීම සම්බන්ධව තීරණයක් ගැනීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා,හෙල උඩ - කුකුලකන්ද මාර්ගය ආරම්භක ස්ථානයේ මෙම ඉඩම පිහිටා ඇති බැවින්,එම නිසා මාර්ගය ආරම්භක ස්ථානය අවහිරවීමක් සිදුවිය හැකි බැවින් ඉදිරියේදී මාර්ගය පුළුල් කිරීමකදී ගැටළු සහගත තත්වයක් ඇති විය හැකි බව පෙන්වා දුන්නේය.

ඒ අනුව එම යෝජනාව සම්බන්ධයෙන් එකගතාවය ලබා දීම නුසුදුසු බවට තීරණය විය.

III. පිල්ලගාව,උඩවෙල,ඕපනායක ලිපිනයේ පදිංචි එම්.තුෂාර චමින්ද අමරවීර මහතාට නාරංගහ ලියද්ද කුඹුරෙන් පර්චස් 10 ක ප්‍රමාණයක නිවසක් ඉදිකිරීම සඳහා කාර්මික නිලධාරීවරයාගේ කොන්දේසි හා නියමයන්ට යටත්ව ලබා දීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා,මෙම කුඹුරු ඉඩම් කොටස් කාර්මික නිලධාරී විසින් පරීක්ෂා කර ඇති බවත්,ඔවුන්ගේ නිර්දේශයන්ට යටත්ව නිවසක් ඉදිකිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවත් සඳහන් කළ අතර එම ඉඩමට අදාල පිඹුරුපත ඇතුළු ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඉදිරිපත් කළ ඇති ලිපි ලේඛන ද සභාවට ඉදිරිපත් කරන ලදී.ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

IV. ජාපහුපංගුගේ මූකලාන සහ ලේල්වල මූකලාන යන සුසාන භූමි පිහිටි ඉඩම් වල වගා කටයුතු සඳහා ගොවිජන දෙපාර්තමේන්තුව වෙත තාවකාලිකව ලබා දීම සම්බධයෙන් අනුමැතිය ලබා ගැනීම.

මෙහිදී අදහස් දැක්වූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.වසන්ත කුමාර මැතිතුමා,වගා කටයුතු සිදුකර නැවත ඉවත් කිරීමට නොහැකි වුවහොත් ගැටළුකාරී තත්වයක් හා පුද්ගල ගැටළුවක් ඇති විය හැකි බව පෙන්වා දුන්නේය.

ඒ අනුව එම යෝජනාව සම්බන්ධයෙන් එකඟතාවය ලබා දීම නුසුදුසු බවට තීරණය විය.

V. පැලැන්දකන්ද ජල ව්‍යාපෘතියේ කැන්දකැටිය කොටස අලුත්වැඩියාව හා පාරිභෝගිකයින් ලියාපදිංචි කිරීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

VI. තලවත්ත ප්‍රජා ජල ව්‍යාපෘතියේ සාමාජිකයින් ලියාපදිංචි කර එම ව්‍යාපෘතිය සභාව සතු කර ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

VII. ජේ.සී.බී.යන්ත්‍රය යොදා පහත සඳහන් වැලිගෙපොල හා ඕපනායක කොට්ඨාස වල මාර්ගයන් සංවර්ධනය කිරීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදී.

- බටේවෙල මාර්ගය
- දොලකන්ද සිට ඉහල ගම්මානයට ගමන් කරන මාර්ගය
- වතු රෝහල-අකරැල්ල මාර්ගය(කෝවිල අසලින්)
- උඩවෙල මීගස්දෙනිය මාර්ගය
- මැදවත්ත සිට මිදැල්ලදෙනියට ගමන් කරන මාර්ගය(අඩි පාර)
- මීගහවෙල වසමේ වරාකැටිය මාර්ගය
- දෙල්වල කන්ද - බටදූර මාර්ගය
- උඩරංවල - දෙල්වල කන්ද මාර්ගය
- ඉළුක්කුඹුර - මැද්දෙකන්ද මාර්ගය
- හටංගල - හැවන්දෙනිය මාර්ගය
- වතු කන්ද මාර්ගය
- හත්තැලිහෙල හරහා අකරැල්ල මාර්ගය
- හඳගිරිය වනෝද්‍යාන මාර්ගය
- කැන්දකැටිය ඇල්ලෙක්කන්ද මාර්ගය
- ගල්හිර මාර්ගය
- ඕපනායක - උඩුකුඹුර මාර්ගය
- ඕපනායක - හේන්යාය මාර්ගය
- මැඳගංඹය මාර්ගය
- වැලිගෙපොල උදේනි වීරසේකර මාර්ගය
- උඩවෙල හොරන්කදුර මාර්ගය
- මාදොළ එගොඩ උයන මාර්ගය

- නරිස්ස බස්න කන්ද මාර්ගය
- මැටිහක්වල සුදුහීන් කන්ද මාර්ගය
- මැටිහක්වල ගම්මැද්ද මාර්ගය
- මහින්දාරාම මාවත
- ගල්පාය කොට්ඨාශයට අයත් මාර්ග

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

VIII. හත්තැල්ල මාර්ගයේ පාලම ඉදිකිරීම සඳහා සභාව සතු අංක 1,2,4,5,6 හා 9 යන කඩ කාමර ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය කරන බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

IX. ගල්හිර සුසාන භූමිය බැදීම සඳහා අවශ්‍ය කම්බි ලබා දීම.(රෝල් 02 ක්)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

X. ජී.අයි.එස්.තාක්ෂණය භාවිතා කර මාර්ග සිතියම් ගත කිරීමේ වැඩ සටහන සඳහා සහභාගි වූ බහු කාර්ය හා දෛනික වැටුප් ලබන සේවකයන් 17 දෙනෙකු සඳහා නොවැම්බර් හා දෙසැම්බර් මාස වල සහභාගී වූ දින ගණන අනුව දිනකට රු:700/- බැගින් දීමනාවක් ලබා දීම සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජවනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

XI. කාර්යාලීය රැස්වීම් ශාලාවට අවශ්‍ය පුටු 500 ක් මිලට ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම අවශය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

XII. රැස්වීම් ශාලා පුටු ලබා ගැනීම සඳහා අවශ්‍ය වන මුදල පියවා ගැනීම සඳහා මුද්දර ගාස්තු වලින් අයකර ගැනීමේ පදනම මත සබරගමුව පළාත් සභාව මඟින් ලබා දෙනු ලබන ණය මුදලක් ලබා ගැනීම අවශය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

XIII. ඉන්ටර්කොම් හා අන්තර්ජාල පහසුකම් කාර්යාලය වෙත ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

XIX. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක ඉඩම් සැලසුම් හා ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම,අනුමත කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි .

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

XV. මොරවිටිවල ප්‍රජා ශාලාවේ වහල ඉදිකර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්ලිව්.සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

XVI ගල්හිර ප්‍රධාන සුසාන භූමියේ ගිමන්හල ඉදිකර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය බව යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී වයි.කේ.අයි.තමරා කුමාරි යටිකිඳ මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

XVII. හෙල බොජුන්හල පරිපාලන කටයුතුවලට සිදුවන බාධා වීම් හේතුවෙන් කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව මඟින් ලබා ගත් උපදේශන සේවාවලින් බැහැර වීම අවශ්‍ය බව යෝජනා කරන ලදි.

ඒ අනුව එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම් ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 6. කාරක සභා වාර්තා සලකා බැලීම.

### 6.1. මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තා .

2023.02.09 හා 2023.03.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා වාර්තාව මහා සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදි.

### 6.2. ප්‍රතිසම්පාදන වාර්තා

2023.02.08 වන දින පැවති ප්‍රතිසම්පාදන කමිටු වාර්තා මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදි.

## 7.ආදායම් වියදම් වාර්තා

7.1. 2023 ජනවාරි මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 1,364,064.58 | වැටුප් හා දීමනා | 3,957,126.05 |
| කුලී | 601,966.17 | ගමන් වියදම් | 3,000.00 |
| බලපත්‍ර ගාස්තු | 58,000.00 | සැපයුම් හා උපකරණ | 199,053.00 |
| සේවා සඳහා ගාස්තු | 116,500.00 | ප්‍රාග්ධන වත්කම් අළුත් වැඩියා හා නඩත්තුව | 4,650.00 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 4,989.99 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශයක සේවා | 83,207.42 |
| වෙනත් ආදායම් | 3,756,485.01 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාධ මුදල් | - |
| වෙනත් ආධාර | 3,879,195.47 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 9,781,201.22 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | - |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 4,247,036.47 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 274,189.00 |
| පුනරාවර්ථන /ප්‍රාග්ධන ආදායම් එකතුව | 9,781,201.22 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 52,564.67 | සේවක ණය | 180,000.00 |
| තැන්පත් | 209,216.69 | තැන්පත් | 472,870.75 |
| අත්තිකාරම් | 76,000.00 | ණය හිමි | 4,915,526.25 |
| ණය ගැති(කර්මාන්ත) | 2,942,767.34 | අත්තිකාරම් | 193,000.00 |
| සමුච්චිත අරමුදල | 128,258.09 | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | - |
| වෙනත් ලැබීම් එකතුව | 3,408,806.79 | සමුච්චිත අරමුදල | - |
| | | වෙනත් ගෙවීම් | - |
| | | වෙනත් ගෙවීම් එකතුව | 5,761,397.00 |
| මුළු එකතුව | 13,190,008.01 | මුළු ගෙවීම් | 10,282,622.47 |

7.2. 2023 ජනවාරි 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

ඇමුණුම 01 යා කර ඇත.

## 8. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.

- පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමු කර ඇති බව,ප්‍රකාශ කරන ලදි.

## 9. වෙනත් කරුණු

සභා රැස්වීමේ නිමාව

වසර 05 ක් පුරාවට ප්‍රාදේශීය සභාවක් ලෙස අප සැවොම එක්වී කටයුතු කළ අතර ඔබ සියළු දෙනාගේ සහයෝගය මත මේ සියළු සංවර්ධනයන් සිදු කළ බවත් පැවසූ ගරු සභාපතිතුමා ,ඒ වෙනුවෙන් සියළු දෙනාට ස්තූතිවන්ත වන බව පවසමින් දහවල් 12.00 පමණ සභා රැස්වීමේ කටයුතු නිමාවට පත් කළේය.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,<br>
සභාපති,<br>
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.